# මූලික පිරිවෙන් අවසාන විභාගය (නව නිර්දේශය) - මූලාකෘති ප්‍රශ්න පත්‍රය
# (01) සිංහල
## පිළිතුරු පත්‍රය
## I පත්‍රය
## I කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|
| **1** | 2 |
| **2** | 1 |
| **3** | 2 |
| **4** | 4 |
| **5** | 3 |
| **6** | 2 |
| **7** | 3 |
| **8** | 4 |
| **9** | 1 |
| **10** | 2 |
| **11** | 1 |
| **12** | 3 |
| **13** | 1 |
| **14** | 2 |
| **15** | 3 |
| **16** | 2 |
| **17** | 2 |
| **18** | 3 |
| **19** | 4 |
| **20** | 3 |

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|
| **21** | 2 |
| **22** | 3 |
| **23** | 4 |
| **24** | 1 |
| **25** | 2 |
| **26** | 3 |
| **27** | 2 |
| **28** | 3 |
| **29** | 4 |
| **30** | 3 |
| **31** | 3 |
| **32** | 2 |
| **33** | 4 |
| **34** | 3 |
| **35** | 1 |
| **36** | 3 |
| **37** | 2 |
| **38** | 2 |
| **39** | 4 |
| **40** | 2 |

**ලකුණු 1 × 40 = 40**

**මූලික පිරිවෙන් අවසාන විභාගය**
**මූලාකෘති ප්‍රශ්න පත්‍රය**
**පිළිතුරු සඳහා මඟ පෙන්වීම**

# සිංහල I පත්‍රය II කොටස පිළිතුරු

01. කෙටි පිළිතුරු

I. (අ) ශ - තාලුජ (ආ) ෂ - මූර්ධජ

II. (අ) හාස්‍යජනක (ආ) නෂ්ටාවශේෂ

III. (අ) ජය (ආ) ජලය/වතුර

IV. (අ) අණු (ආ) පෞද්ගලික

V. (අ) අවනතිය (ආ) විසංයෝගය/වියෝගය

VI. (අ) කුමාරයෙකු/කුමාරයකු (ආ) වනිතාවන්

VII. (අ) ප්‍රධානෝත්සවය - ප්‍රදානෝත්සවය
(ආ) අනර්ග - අනර්ඝ

VIII. (අ) මා විසින් සීගිරියේ අසිරිසිරි නරඹන ලදි.
(ආ) විසාඛාව පූර්වාරාමය පූජා කළාය.

IX. (අ) කනිෂ්ඨ විද්‍යාලය / කනිටු විදුහල
(ආ) දෙසුම් හල / දේශන ශාලාව

X. (අ) ප්‍රයෝජ්‍ය ක්‍රියා
(ආ) අසම්භාව්‍ය (අනියමාර්ථ) ක්‍රියා

**(ලකුණු 2 x 10 = 20 යි)**

2. රචනා - යෝජිත මාතෘකා

(අ) * අධ්‍යාපනයේ අරමුණ වන්නේ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක භාවයෙන් යුතු ශික්ෂණයක් ලබාදීම යි.
* ගුණ-නැණ බෙලෙන් යුතු දරුවන් බිහිකිරීම සාම්ප්‍රදායික අධ්‍යාපනයේ ලක්ෂණයක් වූ බව.
* අනාගත පරපුරට විෂය දැනුමෙන් පමණක් නොව ගුණාත්මක භාවයෙන් ද යුතු අධ්‍යාපනයක් ලබාදිය යුතු බව.

(ආ) * බෝ වන රෝග මෙන් ම බෝ නොවන රෝග ද සෞඛ්‍ය සම්පන්න සමාජයකට අභියෝගයකි.
* බෝ වන රෝග ඖෂධවලින් නිවාරණය කළ හැකි අතර බෝ නොවන රෝග පාලනය සඳහා පමණක් ඖෂධ භාවිත කරයි.
* බෝ නොවන රෝගවලට හේතුව වර්තමාන සංකීර්ණ ජීවන රටාව හා පාරිසරික බලපෑම්ය.

(ඉ) * භෞතික මෙන් ම ආධ්‍යාත්මික සංවර්ධනය ද රටකට අවශ්‍ය වේ.
* භෞතික සංවර්ධනය ක්‍රමානුකූල ව හැඩගැස්විය යුතු ය.
* මනා කළමනාකාරිත්වයෙන් යුක්ත භෞතික දියුණුවක් මෙන් ම ආධ්‍යාත්මික දියුණුවක ද අවශ්‍යතාව

(ඊ) * සංගීත ආදි කලා නිර්මාණවලින් අපේක්ෂා කරන්නේ රසඥතා වර්ධනය හා වින්දනය යි.
* සංගීතය සෝෂාකාරී හා පීඩාකාරී නොවිය යුතු ය.
* කලාකරුවන්ගේ අවධානය යොමු විය යුත්තේ වින්දන ශක්තියෙන් ඉහළ කර්ණරසායන නිර්මාණ බිහිකිරීම සඳහා ය.

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25 යි

| | | | |
|---|---|---|---|
| 01. | සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළු ව | - | ලකුණු 08 යි |
| 02. | සංවිධානය, නිර්මාණාත්මක භාවය හා ස්වීයත්වය | - | ලකුණු 12 යි |
| 03. | ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම | - | ලකුණු 05 යි |

| | | | |
|---|---|---|---|
| 01. | සාරවත්භාවය | - | ලකුණු 07 යි |
| | විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම | - | ලකුණු 01 යි |

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යූහයට සමීප බව, සරුබව හා සමබව, වචන ගණන 250 සමීප ව පැවතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12 යි

මෙහි දී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශන, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදී අංශ ගැන සලකා බැලිය යුතු ය.

03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි

වියරණ, අත්අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.

- සැලකිය යුතුයි

01. රචනයේ වචන ගණන දළ වශයෙන් 200ට වඩා අඩු වන කල්හි ඉහත දැක්වූ 1, 2, 3 යන කොටස්වලට අනුපාතික ව ලකුණක් තීරණය කළ යුතු වේ.

02. වැදගත් අදහස්, සිත් ගන්නා ප්‍රකාශන ඇති තැන්වල (√) යොදන්න. වැරදි තැන්වල (x) ලකුණු යොදන්න.

03. උක්තාඛ්‍යාත සම්බන්ධ වැරදි තැන් යටින් ඉරක් අඳින්න. අක්ෂර වින්‍යාසය වැරදි වචන වටා රවුමක් අඳින්න.
1, 2, 3 යන කොටස් සඳහා දෙන ලද ලකුණු උත්තරය අග හරස් අතට ලියා එකතු කර, මුළු ලකුණු ගණන ලබාගන්න.

නිදසුන් - $\frac{6}{8}$ $\frac{9}{12}$ $\frac{3}{5}$ $\frac{18}{25}$

සංලක්ෂය - වාක්‍ය රචනා ඇගයීමට පෙර අදාළ ව්‍යූහය කියවා දළ සැලැස්මක් සකස් කරගන්න. ව්‍යූහයට කිසිසේත් අදාළ නොවන සේ ලියා ඇති රචනා ඇගයීමේ දී සාරවත් භාවය සඳහා පිරිනැමිය යුත්තේ ඉතා අඩු ලකුණකි.

03. අරමුණ - යම්කිසි ගද්‍ය කොටසක් කියවා විස්තරාර්ථ වර්ණනා ඉවත් කරමින් මුඛ්‍යාර්ථය වටහා ගෙන එමගින් සමස්තාර්ථය ස්වාධීන භාෂා ව්‍යවහාරයකින් ඉදිරිපත් කිරීමේ හැකියාව මෙහිදී ඇගයීමට ලක් කෙරේ. එමෙන් ම සංස්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව ද ඇගයේ.

03 ප්‍රශ්නය

සාරාංශය

අන්තර්ගතය

1. සිංහලයා හා බුලත අන්‍යෝන්‍ය වශයෙන් බැඳී පවතී.
2. සිංහල සංස්කෘතික උත්සව සඳහා බුලත් යොදා ගැනේ.
3. එමගින් සමාජයේ අන්‍යෝන්‍ය සම්බන්ධතා වර්ධනය වේ.
4. තමා අතින් පෙර සිදු වූ වැරදි නිවැරදි කිරීම බුලත් හුරුලු දීමෙන් සංකේතවත් වේ.
5. අවුරුදු චාරිත්‍ර අතර බුලත්වලට ප්‍රධාන තැනක් ලැබේ.
6. සාම්ප්‍රදායික සමාජ හර පද්ධතීන් බුලතින් සංකේතවත් කරයි.

මුළු ලකුණු ප්‍රමාණය 10 යි

ලකුණු විග්‍රහය

1. අන්තර්ගතය ලකුණු 6 යි
2. වචන ගණන ලකුණු 2 යි
3. ශිල්පීය දක්ෂතා ලකුණු 2 යි

අක්ෂර වින්‍යාසය, පද බෙදීම, ව්‍යාකරණානුකූල භාවය ස්වාධීන භාෂා ව්‍යවහාරය ශිල්පීය දක්ෂතා ලෙස සැලකේ.

වචන ගණන 65 ඉක්මවන කල්හී සැලකිය යුත්තේ මුල්වචන 60 තුළ ඇති ප්‍රධාන අදහස් පමණි. වචන 45ට අඩු කල්හි එහි ඇතුළත් අදහස් ගණනය කොට සුදුසු අනුපාතික ලකුණක් පිරිනමන්න. උත්තරය එක ඡේදයක් සේ ලියා තිබිය යුතු ය. කොටුවක් තුළ පද බෙදා තිබුණ ද පිළිගන්න. එක යට එක අසම්බන්ධිත වාක්‍ය වශයෙන් ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණු ගණන දෙකකි. වචන ගණනයේ දී ලිහිල් පිළිවෙතක් අනුගමනය කරන්න. වචන ගණන දළ වශයෙන් 65ට වැඩි කල්හි හෝ 45ට අඩුවන කල්හි වචන ගණන සඳහා ලකුණු 01ක් පිරිනමන්න.

04 ප්‍රශ්නය - ඡේදය

1. කරනු ලබන ආයෝජන සාපේක්ෂ ව අඩු මට්ටමක පවතින බව.
2. පෞද්ගලික අංශයේ සම්බන්ධතා
3. අ.පො.ස.(සා.පෙළ) ගණිතය, ඉංග්‍රීසි, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කුසලතා යන අංශ සම්බන්ධයෙන් ඇති මූලික දැනුම, කුසලතා හිඟකම හේතුවෙන් ශ්‍රම වෙළෙඳපොළට අවශෝෂණය කර නොගත් ශ්‍රමිකයන්
4. ව්‍යවසායකත්ව කුසලතා වැඩි දියුණු කිරීම.
5. අවශෝෂණය - ඇතුළත් කර නොගත් / එකතු නොකළ
   සංරෝධක - බාධා/ගැටලු

05. ප්‍රායෝගික ලේඛනය

රාජකාරි ලිපිය ලකුණු 15

ලකුණු විග්‍රහය :

- ආකෘතිය 05
- අන්තර්ගතය 07
- ශිල්පීය දක්ෂතා 03

- ආකෘතිය සඳහා   ලකුණු 05 යි
  * යවන්නාගේ නම, ලිපිනය, දිනය   ලකුණු 01 යි
  * ලබන්නාගේ ලිපිනය   ලකුණු 01 යි
  * ආමන්ත්‍රණය   ලකුණු 01 යි
  * මාතෘකාව   ලකුණු 01 යි
  * තනතුර හා අත්සන   ලකුණු 01 යි

- අන්තර්ගතය සඳහා   ලකුණු 07 යි

* විජිතපුර නගරයට දුරින් ඉහළමුල්ල ග්‍රාමය පිහිටා ඇත.   (ලකුණු 01 යි)
* එහි යාමට ඇත්තේ දොළපාර මාවත පමණි.   (ලකුණු 01 යි)
* එය වසර 5ක් තිස්සේ අබලන්ව ඇති අතර, ධාවනය වූ එකම බස් රථය ද ඉවත් වී ඇත.  (ලකුණු 01 යි)
* ගමේ පවුල් 80ක් පමණ විවිධ දුෂ්කරතාවලට මුහුණ පා සිටිති.   (ලකුණු 01 යි)
* දොළ පාර මාවත පිළිසකර කිරීමේ ඇඩි අවශ්‍යතාව   (ලකුණු 01 යි)
* ග්‍රාම සංවර්ධන සමිතියෙන් මෙම ඉල්ලීම කරන බව   (ලකුණු 01 යි)
* ඒ වෙනුවෙන් අවශ්‍ය කටයුතු කර දෙන ලෙස පළාත් මහ ඇමතිතුමාගෙන් කරන ඉල්ලීම. (ලකුණු 01 යි)

* ආකෘතිය සඳහා ලකුණු පිරිනැමීමේදී පැරණි ක්‍රමය හා නව ක්‍රමය යන දෙක ම පිළිගන්න.

- ශිල්පීය දක්ෂතා   ලකුණු 03 යි

**නැතහොත්**

**ආරාධනා පත්‍රය**

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 15 යි.

1, 2, 3 යන අංශ සඳහා ලකුණු වෙන් වෙන් ව දී ලකුණු එකතුව ලබා ගන්න.

1. ආකෘතිය සඳහා   ලකුණු 05 යි.
2. අන්තර්ගතය සඳහා   ලකුණු 07 යි.
3. ශිල්පීය දක්ෂතා සඳහා   ලකුණු 03 යි.

01. ආකෘතිය සඳහා ලකුණු 05 යි.
   1. මාතෘකාව   ලකුණු 01 යි.
   2. ආරාධනාකරන්නාගේ නම   ලකුණු 01 යි.
   3. ආරාධනා කරන දිනය   ලකුණු 01 යි.
   4. නිර්මාණාත්මක බව   ලකුණු 02 යි.

02. අන්තර්ගතය සඳහා ලකුණු 07 යි.
   1. පිරිවෙණේ නම   ලකුණු 01 යි.
   2. වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය 2018   ලකුණු 01 යි.
   3. දිනය, වේලාව හා ස්ථානය   ලකුණු 01 යි.
   4. ප්‍රධාන ආරාධිත අමුත්තා   ලකුණු 01 යි.
   5. විශේෂාංග සඳහා   ලකුණු 01 යි.
   6. වෙනත් සහභාගිවන්නන්   ලකුණු 01 යි.
   7. ආරාධනාව ලබන්නා   ලකුණු 01 යි.

03. ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 03 යි.

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, වියරණ, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

- ▲ නියමිත වචන ගණන අඩු වන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණක් දෙන්න.

- ▲ නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිමය ලකුණු 03 කි.

# සිංහල II පත්‍රය පිළිතුරු

1. අපේක්ෂණය - නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම
   මුළු ලකුණු 20 යි.

   ලකුණු විග්‍රහය - මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිතය
   අනු ප්‍රශ්න 10ක් ඇතුළත් වේ. එක් අනු ප්‍රශ්නයක එක කොටසකට ලකුණු 01 බැගින්
   මුළු ලකුණු 20 කි.

1. (i) (අ) පරවි සන්දේශය / කාව්‍යශේඛරය
   (ආ) කැලණියේ විභීෂණ දෙවි

   (ii) (අ) 'සිලිඳු'
   (ආ) බබෙහාමි ආරච්චිල

   (iii) (අ) පාලි රසවාහිනීය.
   (ආ) ගම්පොළ සාහිත්‍ය යුගය.

   (iv) (අ) බෝසතුන්ගේ පූර්ව භවයන්ට අදාළ චරිත කථා
   (ආ) පරාක්‍රම ඇමතිවරයා.

   (v) (අ) බණ දැන පින්කම්වල හැසිර නිවන් සාදා ගැනීම
   (ආ) ධම්මපදට්ඨ කථාව

   (vi) (අ) මෙනරම්බා හිමි රූ සිරිනි මනහර
   (ආ) පැරකුම්බා නරනිඳු සඳ දකු මිතුර

   (vii) (අ) තිඹිරි ගෙයි දීම මිය ගිය දැරියක වෙනුවෙන් පියෙකු නගන ශෝකාලාපය
   (ආ) ගුණදාස අමරසේකර මහතා.

   (viii) (අ) වෙදරාළ / පුන්චිරාළ
   (ආ) කර්ලිනා හාමි

   (ix) (අ) පී.බී. අල්විස් පෙරේරා.
   (ආ) ආරච්චිරාල / අයියනායක / බුදුරුව

   (x) (අ) පී.බී. අල්විස් පෙරේරා / සාගර පළන්සූරිය
   (ආ) අනුස්මරණය / වසන්ත කාලය / බුදුරුව

**(ලකුණු 2x10 = 20 යි)**

2. (i) (අ) බුදුරදුන් විසින් භික්ෂූන් වහන්සේලාහට, නන්ද තෙරුන් රහත් භාවයට පත්ව ඇතැයි මුසා බස් ප්‍රකාශ කරන බවට භික්ෂූන් වහන්සේලාගෙන් චෝදනා එල්ල වූ අවස්ථාව
   (ආ) සෙවිලි කිරීම පිළිබඳ නොදැනීමෙන්
   තාවකාලිකව/අදාළ අවස්ථාවට පමණක් කෙලෙස් යටපත් කිරීම

   (ii) (අ) සූර්ය මණ්ඩලය ශෝභමාන වූ ඉන්ද්‍රනීල මාණික්‍යයක් මෙන් තද නිල් පැහැයෙන් විශාල ආකාශය නැමති ගසෙහි දිසා නැමති අතු අතරෙහි හැසිරෙන සවස සුළඟ විදීම නිසා අවරගිර නැමති නටුවෙන් වැටෙන්නට කාලය ළං වූ ඉදුණා වූ රක්ත වර්ණ වූ ගෙඩියකට සමාන වේ.
   (ආ) පතසන් - වැටෙන්නට ආසන්න වූ
   විලිකුන් - හොඳින් ඉදුණු

(iii) (අ) කුණ්ඩලකේසී කථා වස්තුවෙහි සඳහන් සොරා කුණ්ඩලකේසීගේ ආභරණ ගැනීමට උපායක් කල්පනා කරමින් ආහාර නොගෙන ඇඳට වැටී සිටින අවස්ථාවේ දී කලකිරී සිටීමට හේතුව කුමක් දැයි කුණ්ඩලකේසී අසන ලද පැනයට සොරා පිළිතුරු දුන් අවස්ථාව හා සම්බන්ධය.

(ආ) යාදිනියක් - යාඥාවක්/ආයාචනයක්

මුසුප්පුව - කලකිරී

(iv) (අ) දිනක් සිලිඳු තමන්ගේ නිවස ඉදිරිපිට වාඩි වී සිටින විට පුන්චි මැණිකා සිලිඳු ළඟට ගොස් ඔහුගේ මුහුණ දෙස බලන විට ඔහු දැතින් අල්ලාගෙන පුන්චි මැණිකා සමග කතා කරන අවස්ථාව

(ආ) පුංචි මැණිකාට

(v) (අ) මාලේ මුතු ඇට

(ආ) රාත්‍රී කාලයට අහසින් වැටෙන පිනි බින්දු දකින විට අක්කාගේ මුතු ඇමුණු මාලය මතක් වීම.

**(ලකුණු 4x5 = 20 යි)**

ප්‍රශ්න අංකය 03

ප්‍රශ්න අංක 03 - 07 තෙක්

අපේක්ෂණය - ඇගයීම, ප්‍රකාශනය, භාවිත හැකියාව හා රස වින්දන හැකියාව ඇගයීමට ලක් කිරීම.

ලකුණු විග්‍රහය - 3, 4 ප්‍රශ්න අනිවාර්ය යි. ලකුණු 15 යි.

5, 6, 7 ප්‍රශ්නවලින් එකක් පමණක් තෝරා ගත යුතු යි. ලකුණු 10 යි.

3. (අ) පුංචි මැණිකාගේ චරිතය

* පුංචි මැණිකා තම පියාට ආදරය කරන තැනැත්තියකි. හිතුවක්කාර චරිතයක් නොවේ. “අප්පොච්චි ! අප්පොච්චි ! මාව මරන්ඩ වගේ ඇයි ඔහොම කතා කරන්නේ? මමවත් නංගිවත් කවදාවත් අප්පොච්චි අත් ඇරලා යන්නේ නෑ”

* පුංචි මැණිකා පතිව්‍රතය රැකි ළඳකි. අසභ්‍ය ක්‍රියා සඳහා ඇය සහාය නොදක්වයි.

“උත්සාහයෙන් පලක් වූයේ නෑ. කොලුවා කී සියල්ල අසා සිටි පුංචි මැණිකා කළේ ඔහුට අඬ අඬා ගෙදර දුවන සේ හොඳ කම්මුල් පහරක් ගැසීමය”

“චී අයියා ඔය විදියෙ කතා කියන්ඩ එපා.”

* දැඩි ඉවසීමක් සහිත තැනැත්තියකි.

“මොනවා කියන්ඩ ද අයියා මට ඒක කරන්ඩ බෑ. එහෙම එකක් අපට වෙන්ඩ තියෙනවා නම් වෙච්චාවේ.”

“හිරපල්ලා තම කථාවෙන් බලාපොරොත්තු වූයේ හිස අත් බඳාගෙන කෑ ගසන ගැහැනියකගේ විලාපයකි. එහෙත් පුංචි මැණිකා නිශ්ශබ්දව ම එතැනින් ගොස් නැවතත් බිත්තිය අද්දර ඇන තියා ගැනීම ඔහුගේ මවිතයට හේතු විය”

* තම ස්වාමියාට ආදරය කළ තැනැත්තියකි. ඔහුට කරදරයක් වූ විට ඇය හදවතින් ම දුක්වේ.

‘ඉතින් අප්පච්චි කෝ මගෙ මිනිහ? එයාට මුකුත් වේවි ද? ඒ මිනිස්සු එයාට මොනවා කරාවි ද? මරා දමා වි ද?

* පුංචි මැණිකා දැඩි අධිෂ්ඨානයකින් යුක්ත තැනැත්තියක් වූවාය.

“පිළියෙල කරගත් කුරක්කන් රොටි කීපයකුත් ගමන ගැන ඇසූ ගම්මුන්ගෙන් ලැබුණ තවත් ධාන්‍ය ඇට ටිකකුත් ලේන්සුවක ඔතාගෙන ඈ කඹුරුපිටිය බලා පිටත් වූවාය.”

(ආ) බබුන්ගේ චරිතය

* බබුන් සෘජු තීරණ ගත් කෙනෙකි.

  "මම වෙන කිසිම ගෑනියක් ගන්නේ නෑ. මං කැමති ඈට. ඈ ලස්සනයි. හොඳයි. මේ ගමේ අනෙක් ගෑනු වගේ නෙමෙයි ඈ."

* උත්සාහවන්ත හා කම්මැලි නැති තරුණයෙකි.

  "බොහෝ වෙහෙස මහන්සි වී වැඩ කළ බබුන් හේන හොඳින් එළි කළේය. එය හොඳින් රැකබලා ගත්තේය. ඔහුගේ අස්වැන්න ගමේ හොඳ අස්වැන්න හැටියට ගැණින."

* අවංක චරිතයක් වන ඔහු විවෘත චරිතයකි.

  'පුංචි මැණිකා නැතුව ජීවත් වෙන්ඩ මට බෑ. ඈ නිසා අක්කත් මස්සිනාත් එක්ක කෝලාහල කරගෙන මං ඔවුන්ගේ ගෙදරින් පිටවුණා. මං උඹෙන් දෑවැද්දක් ඉල්ලන්නේ නෑ."

* සාම්ප්‍රදායානුකූලව සිතන තැනැත්තෙකි.

  "ඒගොල්ලො මට කීවෙ මෙන්න මේ පැත්තෙ කොහෙද හොඳට වහින හොඳට කුඹුරු පැහෙන ගමකින් හිරයක් අරගෙන එහෙ පදිංචි වෙන්ඩ කියා. ඒත් ඒක මහ විපත්තියක් නේ ! නාන්නාඳුනන රටක නන්නාඳුනන මිනිස්සුත් එක්ක ඉන්න එක"

  ආදී නිදසුන් යොදා ගෙන විස්තර කළ යුතු ය.

**නැතහොත්**

(අ) සංකල්ප රූප භාවිතය

* 'සිසිර කුමරි පස්සට ලන්නී'
* 'ජම්බු ගහට රත පොරවන්නී'
* 'ගමේ මැ පුහුලම් ඉදවන්නී'

(ආ) ස්වාභාවික පරිසරය වර්ණනා

* 'එරබදු පැහැයෙන් දූලවන්නී'
* 'මල්ගොමු ගුමු ගුමු ගන්වන්නී'

වැනි සුදුසු උදාහරණ යොදා ගෙන ලියා තිබිය යුතු ය. **(ලකුණු 15 යි)**

04. (අ) ශබ්ද රසයෙන් යුක්තවීම

* 'පොහොසද්දන ඇති තුනු රුවන බැති පෙමා'
* උදේ සැපත් සුරගුරු අලු කර අවට
* ලොවැ විහිදා සුදු පැහැ සඳ රැසෙව් සැදි
* වලඳින අදහසින් මෙන් සුර ගඟ අඟන
* ගවසා සුපුල් කඩුපුල් මල් නිල්වරල
* පැහැ සරණිය මිණි පැමිණිය කොත් අගට

(ආ) අර්ථයෙන් විසිතුරු වීම

* 'පෙරව සඳ කිරණ පිපි කුමුදු මල් වටින්'
* 'සලා දුලා පියොවුරු තඹර රොන් රත'
* 'අවට සුපිපි සපු දුනුකේ සලලාන'
* 'මනහර නා මෙණෙවියනිඳ ළ වැලි පිට'
* 'වදිමින් සවස නල හැසිරෙන දිගතුවල'
* 'විදෙන ලෙළන නරුබර පුළුලුකුළැ රැඳී'

මේ සඳහා අදාළ කරගත හැකි වෙනත් නිදසුන් ද ලියා ඇති කල්හි සම්පූර්ණ ලකුණු දෙන්න.

**නැතහොත්**

(අ) කල්‍යාණ මිත්‍රත්ව ඇති කර ගැනීම

* "එකල බෝධිසත්වයෝ ඉදින් මම බැගෑපත් ව ඇඬීම් නම් මාගේ බන්ධූහු භයපත් ව ගොදුරු නො කා සා දුකින් පලායන්නාහු .........."

* "මහරජ, භය නොගන මැනව. මම මගේ ජීවිතය දී පියා වී මුත් නුඹ වහන්සේ මලින් ගලවා ලමි යි අස්වසා කියමින් සමීපයට බැස මඩ මත්තේ වැඩ හුන්හ."

* "සුවපත් වූ නුඹ වහන්සේට සේවය කොට දුකට පැමිණි වේලෙහි ඇර පියා ඒකාන්තයෙන් නොයෙමි. නුඹ වහන්සේ මරණපාසයෙන් බැඳුණු සේක. මම ස්නේහපාශයෙන් බැඳී ගියෙමි."

* "නුඹ වහන්සේට යමක් පැමිණියේ වී නම් මමත් ඒ විඳිනා කැමැත්තෙමි. යනාදීන් තමන්ගේ දෘඪ මිත්‍රත්වය බෝධිසත්වයන්ට ප්‍රකාශ කොට කිවූ ය."

* "මුන් වහන්සේ මට රජ සේක. ජීවිත සමාන වූ මිත්‍ර වූ සේක. ඒ කාරණයෙන් මාගේ ජීවිතාන්තය දක්වාත් ඇර නො යම් කීවා හු ය."

(ආ) විවිධ අභියෝග ජය ගැනීමේ වැදගත්කමය.

* මස් කැඩී ඇට බිඳී ගිය ද තම මිත්‍ර වර්ගයාට සේවය කිරීම සඳහා ඉවසා සිටීම.

"පළමු කොට කකුලේ සම් කැඩී ගියේ ය. දෙවෙනි ව මස් කැඩී ගියේ ය. තුන්වෙනු ව ඇටයෙහි ඇසිර සිට ලේ වැහෙන්නට පටන්ගෙන බලවත් වූ දුක්ඛවේදනා පැවැත්ණේය."

* "එම්බල ප්‍රාණඝාත කොට ජීවත්වන්නා වූ වැදි පුත්‍රයාණෙනි." මුන් වහන්සේ මට රජ සේක, ජීවිතය සමාන වූ මිත්‍ර වූ සේක. ඒ කාරණයෙන් මාගේ ජීවිතාන්තය දක්වාත් ඇර නොයම් කීවාහු ය."

* "එසේ හෙයින් මා හැරගෙන හංස රජ්ජුරුවන් හැර පියව. ඉදින් උන්වහන්සේ මලින් මුදවා මාත් පළායෙත් යන්නක් නොසිතා පළමු කොට මා බැඳගෙන පසුව මුන්වහන්සේ හැර පියව."

* ඒ අසා සුමුඛයෝ සබඳ භය නොගනුව. රූක්ෂ වූ ක්‍රෑර වූ ක්‍රියා ඇති, ලෙයෙන් තෙත් වූ අත් ඇති, තොප පවා මධුර වූ මාගේ ධර්ම කථායෙන් මොළොක් කොට මා හා පිට එළා වසඟ කෙළෙමි."

(උදාහරණ සඳහා ලකුණු 4යි. සමස්ත විස්තරයට ලකුණු 11 යි. මුළු ලකුණු 15 යි)

- 5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු ලියන්න.

5. - ප්‍රජාපතී ගෝතමී නම් කුඩා මෑණියන්දෑගෙන් පූ තන කිරෙහි කිරි මිල ගෙවා ලන්නාක් මෙන් උන් දැ සෝ-වාන් කරවා ...........
   - උන් කියාලූ බස නන්ද කුමරුන් සිත දිවුල් ලාටු මුසු වයිති  තර ව වැද ගන්නා සේ තරයේ ම වැද ගත ......"
   - "බුදුන් වදළ බස මඟුලෙන් හෙළා ලූ කප උගුලවන්නට බැරියා සේ උගුළුවා ලන්නට බැරි හෙයින් ......"
   - "රන් නැවක් මධ්‍ය කොට පිපී වැනී ගිය රත් නෙළුම් වනයක් සේ මේ භික්ෂූ පර්ෂද වඩා හොබිති."
   - "හෂ්ම ප්‍රච්ඡන්න ජාත වේදයක් සේ"
   - "දඹ අත්ත මැඩවූවා සේ ම අප හා වාදත් කළ මැනවැයි"
   - "සත් මාල් මාලිගාවේ උඩු මාලේ ශ්‍රී යහන් ගබඩාවෙක රූපත්ව උපන්නාට පාටොපයට සිරිගෙයක ලූවා සේ" ලූහ"

6. • “කිසිවක්හට මෙපවත් කීම් නම් මාගේ බණ ඇසීමට අන්තරාය වෙයි. දරුවෝ නම් දුර්ලභ නොවෙති. කප් අසඞ්ඛ්‍යයෙකිනුත් බුදු කෙනෙකුන් වහන්සේ ලොව පහළ වීම දුර්ලභ හෙයින් .......”

• “මෙතැන්හි මෝහට මන්ත්‍රයෙන් හා ඖෂධයෙන් ප්‍රයෝජන කවරේ ද; සත්‍යක්‍රියා නමැති ඖෂධය ම උතුම් වන්නේ ය.”

• “මෙසේ ශ්‍රද්ධාවන්ත ස්ත්‍රීහු පවා පහන් සිතින් ආදර සහිත ව බණ අසා එවැනි උග්‍ර වූ තද විෂය පවා පහ කොට තමන් විසින් කරන ලද එම කුශලානුභාවයෙන් දෙව්ලොව ඉපද .............”

• “ඒ විෂශෙෂය සත්‍යක්‍රියානුභාවයෙන් නැති කෙරෙමි යි කියා සත්‍ය ක්‍රියා කරනසේක්.”

• සද්ධර්මය අද මා විසින් ඉඳුරා අසන ලද්දේ වී නම් ඒ සත්‍යය හේතු කොට ගෙන ........”

• “මේ ධර්මය නම් බුදුන් විසින් පසස්නා ලද්දේ ය. සංසාර නමැති සාගරයෙන් එතරවීමට මහ නැවක් වැන්න.”

7. • “සුරත් පුල් උවන් කොඳ දත් බබලන්නී”

• “අල්ලා අතින් පාවෙන වනමල් කළඹ”
“වන සුන්දරියගේ රසවත්කම දියුණු ”

• “මල් ගොමු ගුමු ගුමු ගන්වන්නී”
“එරබදු පැහැයෙන් දුලවන්නී”

• “සමන් පිච්ච මල් ඉහිරුණු”
නිල් තණ කොළ පිට්ටනියක්”
(උදාහරණ තුනට ලකුණු 03 යි. සමස්ත විස්තරයට ලකුණු 07 යි. මුළු ලකුණු 10 යි)

* * *